# (ආ) කාර්මික නිෂ්පාදනය

## 1. හැඳින්වීම

පෞද්ගලික අංශයේ මෙන්ම රාජ්‍ය අංශයේ කාර්මික ඒකකයන් වෙත ආමන්ත්‍රිතව යවන ලද ප්‍රශ්න මාලාවක් මගින් 1972 වර්ෂය සඳහා කාර්මික නිෂ්පාදනයට හා සේවා නියුක්තියට අදාළ දත්තයන් ලබා ගෙන ඇත. විශාල කාර්මික ව්‍යාපාර ආයතන කිහිපයක් සම්බන්ධයෙන් තැපෑලෙන් ප්‍රශ්න මාලාවන් යැවීමට අමතරව, දත්තයන් රැස් කිරීමේ කාර්යයන් යුහුසුළුව කරවා ගැනීමේ අටියෙන්, එම ආයතනවලට පෞද්ගලිකව ගොස් කරුණු විමසීමද කර ඇත. පිළිතුරු සැපැයීම සඳහා දෙන ලද කාලය කෙටිවූ නමුදු කර්මාන්ත හිමියන් විසින් ප්‍රශ්න මාලාවට පිළිතුරු සැපැයීම බොහෝ සෙයින්ම සතුටුදායකව කර ඇත. මුළු වශයෙන් සම්පූර්ණ කරන ලද ප්‍රශ්න මාලා 1913 ක් ආපසු ලැබිණ. මෙකී සංඛ්‍යාවෙන් සියයට 15 ක පමණ සඳහන් වී තිබුණේ 1972 දී නිෂ්පාදනයෙහි නිරතව නොසිටි බවය. මේවා බොහොම-යක්ම සාපේක්ෂිත වශයෙන් කුඩා කාර්මික ඒකකයන් වන අතර මේවා 1972 වසර තුළ අක්‍රියව පැවතීමට, දක්වා ඇති හේතු අතරින් ආනයනය කළ අමුද්‍රව්‍ය හිඟකම ප්‍රධාන විය.

1972 දී කාර්මික නිෂ්පාදන වටිනාකම[1] රුපියල් දශලක්ෂ 2,442.4 ක් විය. මින් 1971 දීට වඩා රුපියල් දශලක්ෂ 234.7 ක හෙවත් සියයට 10.6 ක වැඩිවීමක් නියෝජනය කෙරෙයි. 1972 දී පිළිතුරු සැපයූ කර්මාන්ත ඒකක ගණන 1913 ක්වූ අතර 1971 දී එය 1897 ක් විය. 1971 දී හා 1972 දී වාර්තා සැපයූ කාර්මික ව්‍යාපාර ආයතනයන්හි කාර්මික නිෂ්පාදන වටිනාකම රුපියල් දශලක්ෂ 185.1 කින් හෙවත් සියයට 9.7 කින් වැඩිවී තිබේ. මෙම සංඛ්‍යාවෙහි ඇති තුලනාත්මක බව නිසා එය 1972 වසරේ කාර්මික ක්‍රියාකාරිත්වය පිළිබඳ වඩා සුදුසු දර්ශකයක් වෙයි. එසේ වුවද, නිමැවුමේ වටිනාකම, මිළ මට්ටමේ වෙනස්වීම් අනුව වෙනස් විය හැකි වන අතර, පරිමාවේ අඩුවීමක් ඇතිවුවද නිමැවුම් වටිනාකමේ වැඩිවීමක් ඇති විය හැකිය. 1972 දී, කාර්මික නිෂ්පාදිතයන්හි මිළ වැඩිවීම, 1971 දී පැවැති මට්ටම ඉක්මවා සියයට 6 ත් 20 ත් අතර වෙනස් වෙමින් පැවැතිණ. කොළඹ පාරිභෝගිකයින්ගේ මිළ දර්ශකය සියයට 6.3 කින් වැඩිවී තිබේ. මෙම සාධකයන්ගෙන් හෙළිවන කරුණු අනුව නිෂ්පාදන වටිනාකම වැඩිවීමට බොහෝ දුරට හේතුවී ඇත්තේ මිළ වැඩිවීම බව පෙනී යයි.

## 2. කර්මාන්තයන්හි පිහිටීම

බටහිර පළාතෙහි, කර්මාන්ත නිෂ්පාදනය ඉතා දැඩිව සංකේන්ද්‍රනය වී ඇති බව II (ආ) 9 සටහන පෙන්නුම් කරන අතර අනෙකුත් පෙදෙස්වල සාපේක්ෂ වශයෙන් කර්මාන්ත ඇත්තේ සුළු වශයෙනි. බටහිර පළාතෙහි වුවද, කර්මාන්ත සංකේන්ද්‍රනය වී ඇත්තේ කොළඹත් ඒ අවට පෙදෙස්වලත්ය. මුළු කර්මාන්ත නිෂ්පාදන වටිනාකමෙන්, ආසන්න වශයෙන් සියයට 80 කට දායකවී ඇත්තේ අගනුවරින් සැතැපුම් 20 ක් ඇතුළත පිහිටි කර්මාන්-තයන්ය. බටහිර පළාත පමණක්ම මුළු නිෂ්පාදන වටිනාකමෙන් සියයට 92 ක් නිෂ්පාදනය කළ අතර කාර්මික ඒකකයන්ගෙන් ආසන්න වශයෙන් සියයට 80 ක්ම පිහිටා තිබුණේ එම පළාත් සීමාවන් ඇතුළතය. අනෙකුත් පළාත්වල නිෂ්පාදනය ඉතා පහත් මට්ටමක වූ අතර කර්මාන්ත නිෂ්පාදනයේ මුළු වටිනාකමට එමගින් වූ දායකවීම ඉතා අල්පය.

පස් අවුරුදු සැලැස්මෙහි අන්තර්ගත රජයේ ප්‍රතිපත්ති, විශේෂයෙන්ම ග්‍රාමීය පෙදෙස්වල මාර්ග හා ප්‍රවාහන කටයුතු සැලසීම, තෝරා ගැනීමේ පදනමක් මත අභ්‍යන්තර විදුලි සංදේශ සේවා ක්‍රමය දියුණු කිරීම, ග්‍රාමීය පෙදෙස්වලට විදුලි බලය සැපයීම, ආදියට අදාළ ප්‍රතිපත්ති, සැලසුම් කර ඇත්තේ ඒ ඒ ප්‍රදේශයන්හි ආයෝජනය වැඩි කිරීමත් කර්මාන්ත විසුරුවා හැරීමට යෝග්‍ය වාතාවරණයක් ඇති කිරීමත් සඳහාය.

---

1 මෙම කොටසෙහි දක්වා ඇති නිෂ්පාදන සංඛ්‍යා මූර්ත අගයන් නොදක්වයි. සලකා බැලූ කාලච්ඡේදය තුළ සිදුවූ තියුණු මිළ නැගීමේ ප්‍රතිඵලයක් වශයෙන් මෙහි දක්වා ඇති අගයන් බොහෝ දුරට වැඩිවීමක් පෙන්වයි. නිමැවුම් පරිමාවේ වෙනස්කම් දක්වෙන නිෂ්පාදන දර්ශකයක් සකස් කිරීමට නොහැකි වූයේ දත්තයන් ලැබුණු කාලයත් සහ වාර්ෂික වාර්තාව නිකුත් කෙරෙන කාලයත් අතර වූ කාලසීමාව කෙටිවීමය.

3. නිෂ්පාදනය

1972 දී ඉකුත් වසරට වඩා නිෂ්පාදන වටිනාකමෙහි වැඩිවීම වර්තන මිළ අනුව රුපියල් දශලක්ෂ 234.7 ක් හෙවත් සියයට 10.6 ක්වී ඇත. සියයට 13.5 ක්වූ 1971 වර්ෂයේ වැඩිවීමට වඩා මෙම වැඩිවීම සාපේක්ෂිත වශයෙන්, අඩු එකකි. කාර්මික භාණ්ඩ බොහොමයක ඇතිවූ මිළ වැඩිවීම නිමැවුම් වටිනාකමෙ වැඩිවීමට වඩා අධික විය. මෙම සාධකය නිමැවුම් වටිනාකමේ වැඩිවීමට ප්‍රධාන වශයෙන්ම හේතු විය.

ආනයනය කළ අමුද්‍රව්‍ය හිඟවීම නිසා කර්මාන්ත කෙරෙහි ඇතිවූ නිෂේධ බලපෑම් ප්‍රමාණ කළ නොහැක. රාජ්‍ය අංශයේ කාර්මික සංස්ථා කාර්මික නිෂ්පාදනයෙහි ලා ඒවාට ඇති කොටස සියයට 25.7 සිට සියයට 35.6 දක්වා වැඩි කරමින් ඒවායේ නිෂ්පාදන වටිනාකම 1971 දී පැවති රුපියල් දශලක්ෂ 568.9 සිට 1972 දී රුපියල් දශලක්ෂ 871·1 දක්වා වැඩි කර ඇත. මෙකී සංස්ථාවන්හි සේවා නියුක්ත සංඛ්‍යාවද 1971 දී 29,895 සිට 1972 දී 35,981 දක්වා වැඩිවූ අතර, ඉන් සැලකිය යුතු වැඩිවීමක් දක්වීය.

කාර්මික නිෂ්පාදනය පිළිබඳ ප්‍රධාන සංඛ්‍යා සටහන් තුනක් හා අතිරේක සංඛ්‍යා සටහන් දෙකක් මෙම කොටසෙහි ඇතුළත් කර තිබේ. 1969 සහ 1972 දක්වා වූ වර්ෂයන් සඳහා නිෂ්පාදනය හා සේවා නියුක්තිය පිළිබඳ පාථුල සංඛ්‍යා තොරතුරුවල සම්පිණ්ඩනයක් පළමුවැනි II (ආ) 1 සංඛ්‍යා සටහනින් දක්වෙයි. II (ආ) 2 සටහනින් 1968 සිට 1972 දක්වා වූ වර්ෂයන් සඳහා කර්මාන්තය හා ප්‍රධාන නිෂ්පාදිත අනුව වර්ග කරන ලද නිෂ්පාදන දත්තයන් දක්වෙයි. මේ අතර II (ආ) 3 සංඛ්‍යා සටහනින් 1971 දී මෙන්ම 1972 දීත් වාර්තා සැපයූ කාර්මික ඒකකයන් සම්බන්ධ නිෂ්පාදන දත්තයන් දක්වෙයි.

ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදනයෙහි නිරත වූ කාර්මික ඒකකයන් මුළු නිෂ්පාදන වටිනාකමෙන් සියයට 32·7 ක් සඳහා වගකී අතර විශාලතම කාර්මික ගණයද විය. මෙයට අමතර වශයෙන් 1972 දී මෙකී කර්මාන්තයන්හි නිමැවුමේ රුපියල් දශලක්ෂ 55.7 ක වැඩිවීමක් ඇතිවී තිබේ. ආහාර, පාන වර්ග සහ දුම්කොළ කාර්මික ගණය ඇතුළත ඇති පිළියෙල කළ ආහාර සහ දුම්කොළ යන උපගණයන්හි කෘෂිකාර්මික ස්වභාවය නිසා ආනයනය කළ අමුද්‍රව්‍ය මත ඒවා දැඩි ලෙසින්ම යැපීමක් නොමැත. මෙකී උප ගණවලට අයත් වන කාර්මික ඒකක, කිරි නිෂ්පාදිත, ලුණු, එළවළු තෙල්, කපාපු පොල් සහ දුම්කොළ වෙයි. II (ආ) 1 සංඛ්‍යා සටහනින් පැහැදිළි වන පරිදි වටිනාකම රුපියල් දශලක්ෂ 3.5 ක පිරිහීමක් වාර්තා කළ ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත (ඛනිජ තෙල් හා ගල් අඟුරු හැර) හැරෙන්නට ප්‍රධාන කාර්මික ගණ සියල්ලෙහිම නිෂ්පාදිත වටිනාකමෙහි වැඩිවීමක් ඇතිවී තිබේ. මෙයට වඩා විශේෂයක් ඇතිවී තිබෙන්නේ, වටිනාකම රුපියල් දශලක්ෂ 3·5 ක පිරිහීමක් වාර්තා කළ ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත (ඛනිජ තෙල් සහ ගල් අඟුරු හැර) කාර්මික ගණයෙහිය.

රෙදිපිළි, ඇඳුම් පැළඳුම්, හා සම නිෂ්පාදිත රුපියල් දශලක්ෂ 88·3 කින්ද, සකස් කල ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර සූත්‍ර හා ප්‍රවාහන උපකරණ රුපියල් දශලක්ෂ 31·3 කින්ද, නිමැවුම වැඩිවිය. මුළු කාර්මික නිෂ්පාදනයෙහිලා ඒවාට ඇති කොටස පිළිවෙලින් සියයට 16.1 සහ සියයට 12·5 ක් විය.

ප්‍රධාන කාර්මික ගණ ඇතුළත කාර්මික උප ගණවල ක්‍රියාකාරිත්වය පිළිබඳ දත්තයන් II (ආ) 2 සංඛ්‍යා සටහනින් දැක්වෙන අතර, මෙකී දත්තයන් විශේෂයෙන්ම අදාළ වනුයේ, වර්ෂය තුළදී ප්‍රසාරණය වූ හා සංකෝචනයවූ ප්‍රධාන කාර්මික ගණවල විශ්ලේෂණයකටය. ආහාර පාන වර්ග සහ දුම්කොළ කාර්මික ගණය සැළකිය යුතු වැඩිවීමක් දැක්විය. ප්‍රධාන ප්‍රසාරණාත්මක බලපෑම දක්නට ලැබුණේ පිළියෙල කළ ආහාර සහ දුම්කොළ උප ගණ දෙකෙහි වූ අතර එහි වැඩිවීම පිළිවෙලින් සියයට 22.7 ක් හා 39.1 විය පිළියෙල කළ ආහාර කාණ්ඩයේ වටිනාකම වැඩිවීමට බොහෝ දුරට හේතු වූයේ, මෙම ක්ෂෙත්‍රයෙහි ක්‍රියා කළ රාජ්‍ය සංස්ථාවන්ගේ නිමැවුම් වටිනාකමෙහි වැඩිවීමය.

නිෂ්පාදන වටිනාකමේ විශාල වැඩිවීමක් වාර්තාවී තිබෙනුයේ, රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම්භාණ්ඩ යන කර්මාන්තයන්හිය. මෙම ගණයෙහි වටිනාකම් වැඩිවීමට නූල් කැටීම, රෙදිපිළි විවීම් හා නිමහම් කිරීම යන උප ගණයෙහි නිමැවුම රුපියල් දශලක්ෂ 81 8 කින් හෙවත් සියයට 48·2 කින් සැළකිය යුතු පරිදි වැඩිවීම ප්‍රධාන වශයෙන්ම හේතු විය. මෙම වැඩිවීමට හේතුව, ජාතික පේෂකර්ම සංස්ථාවෙහි නිමැවුම් වටිනාකම වැඩිවීම මගින් බොහෝ දුරට පැහැදිළි කරවයි. සකස් කළ ලෝහභාණ්ඩ, යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහණ උපකරණ කාර්මික ගණයේ වාර්තාවූ නිෂ්පාදන ප්‍රසාරණයට මුළුමනින්ම පාහේ හේතුවී ඇත්තේ යන්ත්‍ර සූත්‍ර (විදුලි නොවන යන්ත්‍ර සූත්‍ර) සහ ප්‍රවාහන උපකරණයි. මෙම නිමැවුම රුපියල් දශලක්ෂ 57.3 සිට රුපියල් දශලක්ෂ 98·9 දක්වා වැඩි වී ඇති අතර, එය සියයට 72.6 ක වැඩිවීමක් විය. නිෂ්පාදන වටිනාකමෙහි වාර්තා වූ මෙම වැඩිවීමට හේතු වී ඇත්තේ 1971 සමීක්ෂණයට ඇතුළත් නොවූ විශාල කාර්මික ඒකකයන් කිහිපයකින් දත්තයන් ලැබීමය. අනෙකුත් කාර්මික ගණ අතර නිෂ්පාදනයෙහි ලං කැපී පෙනෙන වැඩිවීමක් දක්වාලූ එකම උප ගණය වූයේ රසායනික, ඛණිජ, ගල් අඟුරු, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත කාර්මික ගණයේ ඛනිජ සහ ගල් අඟුරු නිෂ්පාදිත උප ගණයයි. මෙම උප ගණය විසින් වාර්තා කර ඇති වටිනාකම් වැඩිවීම රුපියල් දශලක්ෂ 61.0 හෙවත් ව සියයට 30.7 ක් වූ අතර එම වැඩිවීමට හේතු වූයේ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා විසින් නිෂ්පාදනය කරන ලද ඛනිජ තෙල් සහ ඛනිජ නිෂ්පාදිතයන්හි වටිනාකම වැඩිවීමය.

ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත (ඛනිජ තෙල් සහ ගල් අඟුරු) කාර්මික ගණයේ නිෂ්පාදනයෙහි සුළු පිරිහීමක් දක්නට විය.

රුපියල් දශ ලක්ෂ 6·3 ක ආන්තික පහත වැටීමක් වාර්තා වූ සිමෙන්ති, සිමෙන්ති නිෂ්පාදිත සහ ඇස්බෙස්ටෝස් නිෂ්පාදන උප ගණයෙහි හැරුන විට, එක් එක් උප ගණවල නිමැවුම් වටිනාකමෙහි සැලකියයුතු වෙනස්කම් ඇති වී නොමැත. මෙයට ප්‍රධාන හේතුව වී ඇත්තේ ඇතැම් විට ආනයනය කල අමු ද්‍රව්‍ය ප්‍රමානවත් නොවීමෙන් ඇස්බැස්ටෝස් නිෂ්පාදන වල නිමැවුම් පහත වැටීමය.

# 1969-72 කාර්මික නිෂ්පාදනය හා

| කාර්මික ගණය | සමාගම් ගණන | | | | සේවක සංඛ්‍යාව | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 1969 | 1970 | 1971 | 1972 | 1969 | 1970 | 1971 | 1972 |
| I. ආහාර, පානවර්ග සහ දුම්කොළ නිෂ්පාදනය .. .. | 654 | 649 | 527 | 304* | 31889 | 33734 | 33866 | 32776 |
| II. රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම්භාණ්ඩ කර්මාන්ත .. . | 537 | 530 | 634 | 639 | 25469 | 27069 | 22568 | 32908 |
| III. දැව සහ දැව භාණ්ඩ (ගෘහ භාණ්ඩ ඇතුළුව) .. .. | 15 | 11 | 15 | 11 | 3393 | 2907 | 4127 | 4668 |
| IV. කඩදාසි සහ කඩදාසි භාණ්ඩ නිෂ්පාදනය .. .. | 95 | 74 | 74 | 67 | 4876 | 4462 | 4645 | 4323 |
| V. රසායන ද්‍රව්‍ය, පෙට්‍රෝලියම්, ගල් අඟුරු, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදනයන් .. | 276 | 244 | 244 | 196 | 12414 | 16610 | 16888 | 15769 |
| VI. ලෝහ නොවන ඛණිජ නිෂ්පාදනයන් (පෙට්‍රෝලියම් සහ ගල් අඟුරු හැර) .. | 75 | 67 | 51 | 64 | 7811 | 8545 | 9929 | 8595 |
| VII. මූලික ලෝහ නිෂ්පාදිතයන් .. .. | 1 | 1 | 1 | 1 | 960 | 963 | 952 | 1011 |
| VIII. සකස් කළ ලෝහ භාණ්ඩ යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ නිෂ්පාදනය .. . | 282 | 228 | 287 | 280 | 16119 | 12448 | 15089 | 21483 |
| IX. නිෂ්පාදිත භාණ්ඩ (අන් තැනක නොසඳහන්) .. | 27 | 49 | 64 | 64 | 795 | 1367 | 2127 | 2453 |
| එකතුව | 1962 | 1853 | 1897 | 1626* | 103726 | 105105 | 110141 | 123986 |

* 1972 පිළිතුරු සැපයූ ආයතන සංඛ්‍යාවේ පහත වැටීමට විශාල වශයෙන් හේතු වූයේ ශ්‍රී ලංකා දුම්කොළ කර්මාන්ත

II (අා) 1 සංඛ්‍යා සටහන

# සේවා නියුක්ති සංඛ්‍යාමය විස්තර සම්පිණ්ඩනය

| ශ්‍රමික දින එකතුව (දහස් ගණනින්) | | | | වැටුප් බිල (රුපි. දශ ලක්ෂ) | | | | නිෂ්පාදන වටිනාකම (රුපි. දශ ලක්ෂ) | | | | ඒක ශ්‍රම දිනක වැටුප් (රුපියල්) | | | | සේවකයෙකුට වෙන්වන ශ්‍රම දින | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1969 | 1970 | 1971 | 1972 | 1969 | 1970 | 1971 | 1972 | 1969 | 1970 | 1971 | 1972 | 1969 | 1970 | 1971 | 1972 | 1969 | 1970 | 1971 | 1972 |
| 8982 | 9651 | 7747 | 7856 | 58·3 | 64·4 | 70·5 | 82·7 | 641·8 | 684·5 | 743·0 | 798·7 | 6·49 | 6·67 | 9·10 | 10·52 | 282 | 286 | 229 | 239 |
| 6433 | 7352 | 5254 | 8536 | 31·8 | 46·0 | 43·3 | 72·9 | 267·1 | 282·7 | 306·2 | 394·5 | 4·94 | 6·25 | 8·24 | 8·54 | 253 | 272 | 233 | 259 |
| 949 | 738 | 798 | 1099 | 7·0 | 8·8 | 8·8 | 13·3 | 18·0 | 21·2 | 26·6 | 30·7 | 7·38 | 11·89 | 11·03 | 12·09 | 280 | 254 | 193 | 235 |
| 1412 | 1195 | 1228 | 1262 | 10·8 | 10·7 | 11·9 | 11·6 | 62·3 | 65·0 | 70·3 | 79·1 | 7·65 | 8·92 | 9·69 | 11·52 | 290 | 268 | 264 | 291 |
| 3459 | 3782 | 4358 | 4504 | 34·1 | 39·1 | 72·3 | 82·7 | 249·8 | 439·2 | 530·0 | 563·8 | 9·86 | 10·33 | 16·58 | 18·36 | 279 | 278 | 258 | 285 |
| 2131 | 2287 | 2193 | 2345 | 18·6 | 26·1 | 25·8 | 37·4 | 123·3 | 138·8 | 176·4 | 172·9 | 8·73 | 11·42 | 11·76 | 15·96 | 273 | 268 | 221 | 276 |
| 288 | 270 | 220 | 304 | 4·0 | 2·8 | 4·7 | 3·9 | 23·8 | 38·9 | 58·6 | 67·5 | 13·89 | 10·55 | 21·36 | 12·66 | 300 | 280 | 231 | 300 |
| 4501 | 3320 | 3960 | 5033 | 33·7 | 29·4 | 39·8 | 54·9 | 226·2 | 256·1 | 273·5 | 304·8 | 7·49 | 8·87 | 10·05 | 10·90 | 279 | 267 | 262 | 234 |
| 212 | 395 | 474 | 671 | 1·2 | 2·1 | 2·9 | 5·5 | 9·5 | 18·6 | 23·1 | 30·4 | 5·66 | 5·40 | 6·12 | 8·20 | 267 | 289 | 223 | 273 |
| 28367 | 28990 | 26232 | 31610 | 199·5 | 229·4 | 280·0 | 367·9 | 1626·8 | 1945·0 | 2207·7 | 2442·4 | 7·03 | 7·91 | 10·67 | 11·63 | 273 | 276 | 238 | 255 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

සංස්ථාව මගින් සුළු බීඩි නිෂ්පාදන ඒකකයන් විශාල සංඛ්‍යාවක් සම්බන්ධයෙන් ඒකාබද්ධ වාර්තාවක් ඉදිරිපත් කිරීමයි

## 1968/72 කාර්මික නිෂ්පාදනයේ වටිනාකම කර්මාන්තවල

| කාර්මික ගණය | නිෂ්පාදන වටිනාකම (රුපියල් දශ ලක්ෂ) | | | | |
|---|---|---|---|---|---|
| | 1968 | 1969 | 1970 | 1971 | 1972 |
| 1· ආහාර පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදනය .. | **609·6** | **641·8** | **684·5** | **743·0** | **798·7** |
| (අ) සැකසූ ආහාර .. .. .. | 250·0 | 230·5 | 250·6 | 263·2 | 322·9 |
| (ආ) එළවළු තෙල් වර්ග සහ මේද .. .. | 162·0 | 169·5 | 170·1 | 190·4 | 143·9 |
| (ඇ) කල්තබාගත හැකි සහ ටින්වල අසුරන ලද පළතුරු, එළවළු, මස් මාළු සහ අනෙකුත් මුහුදු ආහාර .. | 8·4 | 8·6 | 11·8 | 23·2 | 11·5 |
| (ඈ) බිස්කෝතු, කොකෝවා, චොකලට් සහ සීනි රසකැවිලි | 44·3 | 49·9 | 50·5 | 53·1 | 50·2 |
| (ඉ) පාන වර්ග සහ ස්ප්‍රීතු .. .. .. | 34·4 | 77·4 | 94·9 | 88·1 | 96·5 |
| (ඊ) දුම්කොළ .. .. .. | 110·5 | 105·9 | 106·6 | 124·9 | 173·7 |
| 2· රෙදිපිලි, ඇඳුම් පැළඳුම් සහ සම්භාණ්ඩ කර්මාන්ත .. | **224·3** | **267·1** | **282·7** | **306·2** | **394·5** |
| (අ) ගොතන ලද ඇඳුම් පැළඳුම් සහ මැසූ ඇඳුම් හා අනෙකුත් ආයිත්තම් (පාවහන් හැර) .. .. | 55·7 | 56·0 | 64·3 | 70·8 | 66·7 |
| (ආ) නූල් කැටීම, රෙදිපිළි විවීම සහ නිම කිරීම .. | 136·2 | 172·2 | 173·3 | 189·4 | 271·2 |
| (ඇ) පාවහන් සහ සම් නිෂ්පාදිතයන් .. .. | 32·4 | 38·9 | 45·1 | 46·0 | 56·6 |
| 3· දැව සහ දැව භාණ්ඩ නිෂ්පාදනය (ගෘහ භාණ්ඩ ඇතුළුව) .. | **16·9** | **18·0** | **21·2** | **26·6** | **30·7** |
| (අ) දැව නිෂ්පාදිත .. .. .. | 8·0 | 9·2 | 10·4 | 12·8 | 12·7 |
| (ආ) තුනී ලෑලි .. .. .. | 8·9 | 8·8 | 10·8 | 13·8 | 18·0 |
| 4· කඩදාසි සහ කඩදාසි භාණ්ඩ .. .. .. | **54·6** | **62·3** | **65·0** | **70·3** | **79·1** |
| 5· රසායනික, පෙට්‍රෝලියම්, ගල් අඟුරු, රබර් සහ ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදනය .. .. .. | **203·3** | **249·8** | **439·2** | **530·0** | **563·8** |
| (අ) කාර්මික රසායන ද්‍රව්‍ය .. .. .. | 2·3 | 2·2 | 3·1 | 3·3 | 5·2 |
| (ආ) විවිධ රසායනික නිෂ්පාදිතයන් .. .. | 118·9 | 155·6 | 155·9 | 230·3 | 213·5 |
| (ඇ) පෙට්‍රෝලියම් සහ ගල්අඟුරු නිෂ්පාදිතයන් .. | 8·3 | 11·0 | 191·0 | 198·5 | 259·5 |
| (ඈ) රබර් නිෂ්පාදිතයන් .. .. .. | 41·3 | 52·8 | 56·4 | 60·2 | 67·7 |
| (ඉ) ප්ලාස්ටික් නිෂ්පාදිතයන් .. .. .. | 32·5 | 28·2 | 32·8 | 37·7 | 17·9 |
| 6· ලෝහ නොවන ඛනිජ භාණ්ඩ නිෂ්පාදනය (පෙට්‍රෝලියම් සහ ගල් අඟුරු හැර) .. .. | **92·8** | **123·3** | **138·8** | **176·4** | **172·9** |
| (අ) පිඟන් බඩු .. .. .. | 8·5 | 8·7 | 8·0 | 8·5 | 12·9 |
| (ආ) වීදුරු සහ වීදුරු නිෂ්පාදිතයන් .. .. | 4·8 | 7·7 | 8·1 | 13·9 | 11·9 |
| (ඇ) සිමෙන්ති, සිමෙන්ති නිෂ්පාදිතයන් සහ ඇස්බැස්ටෝස් නිෂ්පාදිතයන් .. .. | 70·0 | 89·0 | 104·8 | 116·7 | 110·4 |
| (ඈ) ඉල්මනයිට් නිෂ්පාදනය .. .. .. | 2·2 | 3·1 | 4·7 | 6·2 | 3·7 |
| (ඉ) ගඩොල් සහ උළු .. .. .. | 7·3 | 14·8 | 13·2 | 13·1 | 34·0 |
| 7· මූලික ලෝහ භාණ්ඩ .. .. .. | **27·3** | **28·8** | **38·9** | **58·6** | **67·5** |
| (අ) යකඩ සහ වානේ මූලික කර්මාන්ත .. .. | 27·3 | 28·8 | 38·9 | 58·6 | 67·5 |
| 8· සකස්කරන ලද ලෝහභාණ්ඩ සහ යන්ත්‍රෝපකරණ නිෂ්පාදනය | **167·1** | **226·2** | **256·1** | **273·5** | **304·8** |
| (අ) සකස් කරන ලද ලෝහ භාණ්ඩ (යන්ත්‍රෝපකරණ හැර) | 79·4 | 82·0 | 96·9 | 128·0 | 111·1 |
| (ආ) යන්ත්‍ර සූත්‍ර (විදුලි නොවන යන්ත්‍රසූත්‍ර) සහ ප්‍රවාහන උපකරණ .. .. .. | 45·9 | 77·9 | 70·8 | 57·3 | 98·9 |
| (ඇ) විදුලි යන්ත්‍ර සූත්‍ර, මෙවලම් උපකරණ හා සැපයුම් .. | 41·8 | 66·3 | 88·4 | 88·2 | 94·[illegible] |
| 9· නිෂ්පාදිත භාණ්ඩ (අන් තැනක සඳහන් නොවූ) .. | **2·7** | **9·5** | **18·6** | **23·1** | **30·4** |
| එකතුව .. .. .. | **1398·6** | **1,626·8** | **1,945.0** | **2,207.7** | **2,442.4** |

II (ආ) 2 සංඛ්‍යා සටහන

## ස්වරූපය හා ප්‍රධාන නිෂ්පාදන අනුව

| කර්මාන්තයෙහි සියයට ගණන | | | | | මුළු කාර්මික නිෂ්පාදනයේ සියයට ගණන | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1968 | 1969 | 1970 | 1971 | 1972 | 1968 | 1969 | 1970 | 1971 | 1972 |
| **100·0** | **100·0** | **100·0** | **100·0** | **100·0** | **43·6** | **39·5** | **35·2** | **33·7** | **32·7** |
| 41·0 | 35·9 | 36·6 | 35·4 | 40·5 | 17·9 | 14·2 | 12·0 | 11·9 | 13·2 |
| 26·6 | 26·4 | 24·9 | 25·6 | 18·0 | 11·6 | 10·4 | 8·7 | 8·6 | 5·9 |
| 1·4 | 1·3 | 1·7 | 3·1 | 1·4 | 0·6 | 0·5 | 0·6 | 1·1 | 0·5 |
| 7·3 | 7·8 | 7·4 | 7·2 | 6·3 | 3·2 | 3·1 | 2·6 | 2·4 | 2·0 |
| 5·6 | 12·1 | 13·9 | 11·9 | 12·1 | 2·4 | 4·8 | 4·9 | 4·0 | 4·0 |
| 18·1 | 16·5 | 15·6 | 16·8 | 21·7 | 7·9 | 6·5 | 5·5 | 5·7 | 7·1 |
| **100·0** | **100·0** | **100·0** | **100·0** | **100·0** | **16·0** | **16·4** | **14·5** | **13·9** | **16·1** |
| 24·8 | 21·0 | 22·7 | 23·1 | 16·9 | 4·0 | 3·4 | 3·3 | 3·2 | 2·7 |
| 60·7 | 64·5 | 61·3 | 61·9 | 68·8 | 9·7 | 10·6 | 8·9 | 8·6 | 11·1 |
| 14·5 | 14·5 | 16·0 | 15·0 | 14·3 | 2·3 | 2·4 | 2·3 | 2·1 | 2·3 |
| **100·0** | **100·0** | **100·0** | **100·0** | **100·0** | **1·2** | **1·1** | **1·1** | **1·2** | **1·3** |
| 47·3 | 51·1 | 49·1 | 48·1 | 41·4 | 0·6 | 0·6 | 0·5 | 0·6 | 0·5 |
| 52·7 | 48·9 | 50·9 | 51·9 | 58·6 | 0·6 | 0·5 | 0·6 | 0·6 | 0·8 |
| **100·0** | **100·0** | **100·0** | **100·0** | **100 0** | **3·9** | **3·8** | **3·3** | **3·2** | **3·2** |
| **100·0** | **100·0** | **100·0** | **100·0** | **100 0** | **14·5** | **15·3** | **22·6** | **24·0** | **23·1** |
| 1·1 | 0·9 | 0·7 | 0·6 | 0·9 | 0·2 | 0·1 | 0·2 | 0·2 | 0·2 |
| 58·5 | 62·3 | 35·5 | 43·5 | 37·9 | 8·5 | 9·6 | 8·0 | 10·4 | 8·8 |
| 4·1 | 4·4 | 43·5 | 37·4 | 46·0 | 0·6 | 0·7 | 9·8 | 9·0 | 10·6 |
| 20·3 | 21·1 | 12·8 | 11·4 | 12·0 | 3·0 | 3·2 | 2·9 | 2·7 | 2·8 |
| 16·0 | 11·3 | 7·5 | 7·1 | 3·2 | 2·3 | 1·7 | 1·7 | 1·7 | 0·7 |
| **100·0** | **100·0** | **100·0** | **100·0** | **100·0** | **6·6** | **7·6** | **7·1** | **8·0** | **7·1** |
| 9·1 | 7·1 | 5·8 | 4·8 | 7·5 | 0·6 | 0·5 | 0·4 | 0·4 | 0·5 |
| 5·2 | 6·2 | 5·8 | 7·9 | 6·9 | 0·3 | 0·5 | 0·4 | 0·6 | 0·5 |
| 75·4 | 72·2 | 75·5 | 66·2 | 63·8 | 5·0 | 5·5 | 5·4 | 5·3 | 4·5 |
| 2·4 | 2·5 | 3·4 | 3·5 | 2·1 | 0·2 | 0·2 | 0·2 | 0·3 | 0·2 |
| 7·9 | 12·0 | 9·5 | 17·6 | 19·7 | 0·5 | 0·9 | 0·7 | 1·4 | 1·4 |
| **100·0** | **100·0** | **100·0** | **100·0** | **100·0** | **2·0** | **1·8** | **2·0** | **2·6** | **2·8** |
| 100·0 | 100·0 | 100·0 | 100·0 | 100·0 | 2·0 | 1·8 | 2·0 | 2·6 | 2·8 |
| **100·0** | **100·0** | **100·0** | **100·0** | **100·0** | **12·0** | **13 9** | **13·2** | **12·4** | **12·5** |
| 47·5 | 36·3 | 37·8 | 46·8 | 36·5 | 5·7 | 5·0 | 5·0 | 5·8 | 4·5 |
| 24·2 | 34·4 | 27·6 | 21·0 | 32·4 | 3·3 | 4·8 | 3·6 | 2·6 | 4·1 |
| 28·3 | 29·3 | 34·5 | 32·2 | 31·1 | 3·0 | 4·1 | 4·5 | 4·0 | 3·9 |
| **100·0** | **100·0** | **100·0** | **100·0** | **100·0** | **0·2** | **0·6** | **1·0** | **1·0** | **1·2** |
| | | | | | **100·0** | **100·0** | **100·0** | **100 ·0** | **100·0** |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

නිෂ්පාදන වටිනාකමෙහි වැඩිවීම අනුව කර්මාන්ත උප ගණයන්හි වර්ගීකරණයක් II (ආ) 2 (1) දරන අතිරේක සටහනෙහි දැක්වේ. පිළියෙළ කළ ආහාර, ඛනිජ තෙල් සහ ගල් අඟුරු නිෂ්පාදිත සහ නූල් කැටීම් සහ රෙදි වියීම යන උප ගණයන්හි වටිනාකම් වැඩිවීම් ඉහලම ප්‍රමාණයන් වාර්තා කර ඇති අතර, මෙකී එක් එක් උප ගණයන්හි නිෂ්පාදන වටිනාකම් රුපියල් දශලක්ෂ 50කට හෝ ඊට අධික ප්‍රමාණයක් පෙන්වයි. මෙම ගණයන්හි සීඝ්‍ර වර්ධනයක් ඇති බව පෙනේ. මීට පෙර වසරේ පවා ඒවායේ නිෂ්පාදන අගය සෑහෙන ප්‍රමාණයකට වැඩිවී තිබුනි.

## II (ආ) 2 (1) සංඛ්‍යා සටහන

## කර්මාන්ත උප ගණ අනුව නිෂ්පාදන වටිනාකමේ වැඩිවීම

| රු: 0 – රු දශලක්ෂ 5 දක්වා | රු දශලක්ෂ 5 – 20 දක්වා | රු. දශලක්ෂ 20 – 50 දක්වා | රු. දශලක්ෂ 50 ට වැඩි |
|---|---|---|---|
| තුනී ලෑලි | බීර, ස්ටවුට සහ අරක්කු | දුම්කොළ | සැකසූ ආහාර |
| කාර්මික රසායනික ද්‍රව්‍ය | පාවහන් සහ සම් නිෂ්පාදන | යන්ත්‍රසූත්‍ර (විදුලි උපකරණ හැර) | පෙට්‍රෝලියම් සහ ගල් අඟුරු නිෂ්පාදන |
| පිඟන් නිෂ්පාදන | කඩදාසි සහ කඩදාසි නිෂ්පාදන | | නූල් කැටීම සහ රෙදි පිළි වියීම |
| ගඩොල් සහ උළු | යකඩ සහ වානේ විදුලි උපකරණ නිෂ්පාදිත භාණ්ඩ අ. ස. නො. | | |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

දුම්කොල සහ යන්ත්‍ර සූත්‍ර (විදුලි උපකරණ හැර) උප ගණයන් රුපියල් දශලක්ෂ 20 සිට රුපියල් දශලක්ෂ 50 දක්වා වෙනස් වන පරිදි සිය වැඩිකර ගැනීම දක්වා ඇත. 1971 දී රුපියල් දශලක්ෂ 5 සිට රුපියල් දශලක්ෂ 20 දක්වා වූ වැඩිවීම් පෙන්වන ලද කඩදාසි නිෂ්පාදිත සහ යකඩ හා වානේ 1972 දී ද ඒ අයුරින්ම වර්ධනයක් පෙන්වයි.

කලින් සඳහන් කළ අනිකුත් කර්මාන්ත නම් බීර, ස්ටවුට, අරක්කු, පාවහන්, හම් නිෂ්පාදිත, විදුලිමය යන්ත්‍ර සූත්‍ර සහ වෙනත් තැනෙක නොසඳහන් නිෂ්පාදිත වෙයි.

ප්‍රධාන කර්මාන්ත ගණ 9 හි කර්මාන්ත ඒකක සංඛ්‍යාවෙහි වෙනස්වීම් සහ 1971/72 කාලය තුල නිෂ්පාදන වටිනාකමෙහි ඇතිවූ අනුරූප වෙනස II (ආ) 2 (2) අතිරේක සටහනෙහි දක්වා ඇත. මෙම සටහනට අනුව, කාර්මික ගණ දෙකක හැර අනෙකුත් වාර්තා එවා ඇති ඒකක සංඛ්‍යාවෙහි පහළ වැටීමක් සිදු වී ඇති බව පැහැදිලි වෙයි. එසේ වුවද, නිෂ්පාදනයේ මුළු වටිනාකම වැඩි වී ඇත. එක් කාර්මික ගණයක් වන ලෝහ නොවන ඛනිජ නිෂ්පාදන (ඛණිජ තෙල් සහ ගල් අඟුරු හැර) පමණක් නිමැවුම් වටිනාකමේ අඩුවීමක් වාර්තා කර ඇති අතර එය සිදුවී ඇත්තේ, වාර්තා එවන ඒකකයන්හි සංඛ්‍යාවෙහි වැඩිවීමක් තිබියදීත් ය. වාර්තා එවූ ව්‍යාපාර ආයතනයන්ගෙන් අධිකතම අඩුවීම සිදුවී ඇත්තේ ආහාර, පාන වර්ග සහ දුම්කොළ කර්මාන්ත ගණයෙහිය. මෙහි වාර්තා එවූ ව්‍යාපාර ආයතන සංඛ්‍යාව, 223 කින් පහත වැටිනි. මෙම පහත වැටීමට හේතුව නම් ශ්‍රී ලංකා දුම්කොළ කර්මාන්ත සංස්ථාව[1] මගින් සියලුම බීඩි නිෂ්පාදන සුලු ඒකකයන් සම්බන්ධ නිෂ්පාදන දත්තයන් අසුවන පරිද්දෙන් ඒකාබද්ධ වාර්තාවක් ඉදිරිපත් කිරීමයි. මෙම කර්මාන්ත ගණයේ වාර්තා වූ වැඩිවීම රුපියල් දශලක්ෂ 55·7 ක් විය. රෙදිපිලි ඇඳුම් පැළඳුම් සහ සම් කර්මාන්ත ගණය සම්බන්ධයෙන් පිළිතුරු සැපයූ ආයතනයන්හි සංඛ්‍යාව වැඩිවූයේ ආන්තික වශයෙන් වුවද, නිෂ්පාදනය සෑහෙන ප්‍රමාණයකින් වැඩි වී ඇත. මෙම වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතුවූයේ නූල් කැටීම, වියීම, හා රෙදිපිළි නිම කිරීම යන උප ගණයෙහි නිෂ්පාදනයෙහි ඇතිවූ සියයට 16·1 වැඩිවීමය. 1972 දී මෙම උප ගණයෙහි පිළිතුරු සැපයූ ආයතන ගණනත් වැඩිව ඇත. එහෙත් සකස්කළ ඇඳුම් සහ අනෙකුත් ඇඳුම් පැළඳුම් (පාවහන් හැර) සම්බන්ධයෙන් වාර්තා එවූ ඒකකයන් සංඛ්‍යාවෙහි පහත වැටීමක් හේතුකොට එම වැඩිවීම කැපී ගියේය. මේ හැර නිෂ්පාදන වටිනාකමට සැලකිය යුතු අන්දමට දායක වී ඇත්තේ සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ ගණය ය. 1972 දී මෙම ගණයේ වාර්තා එවූ ඒකක සංඛ්‍යාව 7 කින් පහත වැටුනද, නිමැවුම් වටිනාකම රුපියල් දශලක්ෂ 31.3 කින් ඉහළ ගියේය. කලින් සඳහන් වූ පරිදි එයට හේතු වූයේ, 1971 දී වාර්තාවන් නොඑවූ විශාල ව්‍යාපාර ආයතන කීපයක් නිෂ්පාදන දත්ත ඉදිරිපත් කිරීමය.

## II (ආ) 2 (2) සංඛ්‍යා සටහන

### වාර්තා සැපයූ ආයතන සංඛ්‍යාව සහ නිෂ්පාදන වටිනාකම

| | කාර්මික ගණය | වාර්තා සැපයූ ව්‍යාපාරික ආයතන සංඛ්‍යාවේ වෙනස | නිෂ්පාදන වටිනාකමෙහි වෙනස, (රුපියල් දශලක්ෂ) |
|---|---|---|---|
| I. | ආහාරපාන සහ දුම්කොළ .. | −223 | + 55·7 |
| II. | රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් කර්මාන්ත .. | + 5 | + 88·3 |
| III. | දැව සහ දැව භාණ්ඩ නිෂ්පාදිත .. | − 4 | + 4·1 |
| IV. | කඩදාසි සහ කඩදාසි භාණ්ඩ නිෂ්පාදිත .. | − 7 | + 8·8 |
| V. | රසායනද්‍රව්‍ය, ඛනිජතෙල්, ගල් අඟුරු සහ ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදිත | − 48 | + 33·8 |
| VI. | ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත (ගල් අඟුරු හා ඛනිජ තෙල් හැර) .. | + 13 | − 3·5 |
| VII. | මූලික ලෝහ නිෂ්පාදිත .. | — | + 8·9 |
| VIII. | සකස් කළ ලෝහ භාණ්ඩ, යන්ත්‍රසූත්‍ර හා ප්‍රවාහණ උපකරණ නිෂ්පාදිත | − 7 | + 31·3 |
| IX. | නිෂ්පාදිත භාණ්ඩ අ ස. නො. .. | — | + 7·3 |
| | එකතුව | − 271 | +234·7 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

1 ශ්‍රී ලංකා දුම්කොළ කර්මාන්ත සංස්ථාව පිහිටුවන ලද්දේ 1972 දියි. මෙම සංස්ථාවේ ප්‍රධාන කාර්යයන් නම්; I බීඩි ඊතන කොළ ආනයනය, බෙදහැරීම හා විකිණීම.
II බීඩි නිෂ්පාදනය, ඇහිරීම, බෙදහැරීම, විකිණීම හා අපනයනය කිරීම.

1971 සහ 1972 දී වාර්තා එවන ලද කාර්මික ඒකකයන් සඳහා කර්මාන්ත හා නිෂ්පාදන අනුව වර්ග කළ නිෂ්පාදන වටිනාකම මතවූ දත්තයන් II (ආ) 3 වන සටහනේ දැක්වෙයි. මෙකී වර්ෂ දෙකෙහි වාර්තා එවූ මුළු ඒකක ප්‍රමාණය 959 ක් වන අතර එය 1971 සහ 1972 දී දත්තයන් එවන ලද ඒකක ගණනින් පිළිවෙලින් සියයට 50 ක් සහ 59 ක් විය. 1972 කාර්මික ක්‍රියාකාරිත්වයෙහි ලා, කලින් වූ සටහන් දෙකෙහි දැක්වෙන නිරපේක්ෂ සංඛ්‍යාවලට වඩා මෙහි පිළිබිඹු වී ඇති කාර්මික නිෂ්පාදන වටිනාකම් වෙනස තුලනාත්මකව වඩා හොඳ මාර්ගෝපදේශකය වෙයි.

1972 දී වාර්තා සැපයූ ඒකක 959 යේ නිමැවුමේ මුළු වටිනාකම 1971 දී 1898·7 ක්වූ අතර 1972 දී එය රුපියල් දශලක්ෂ 2083·1 ක් විය. එය සියයට 9·7 ක වැඩිවීමකි. නිමැවුම් වටිනාකමේ වැඩිවීමක් තිබුණ ද II (ආ) 3 සංඛ්‍යා සටහන අනුව දක්නා පරිදි 1972 දී කර්මාන්ත වල සමස්ථ ක්‍රියාකාරිත්වය එතරම් හිතකර නොවේ. කර්මාන්ත ගණ 7 ක් නිෂ්පාදන වටිනාකම් වැඩිවීම් වාර්තා කර ඇත එහෙත් මෙම ගණයන්ගෙන් දෙකක් පමණක්, එනම් රසායන, ඛනිජ තෙල්, ගල් අඟුරු, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන සහ රෙදිපිළි, ඇඳුම් පැළඳුම් හා සම කර්මාන්ත, පිළිවෙලින් රුපියල් දශලක්ෂ 97·9 ක සහ 47·8 සැලකිය යුතු වැඩිවීම් දක්වා ඇත. පළමුව සඳහන් කරන ලද්දෙහි වැඩිවීමට හේතු වූයේ (උප ගණ දෙක) ඛනිජ තෙල් හා ගල් අඟුරු නිෂ්පාදන හා විවිධ රසායනික උප ගණයන්හි වැඩිවීම වන අතර දෙවනුව සඳහන් කරන ලද්දෙහි වැඩිවීමට මුළුමනින්ම හේතු වූයේ නූල් කැටීම, වියීම සහ රෙදිපිළි නිම කිරීම යන උප ගණය වෙයි. අනිකුත් කර්මාන්ත ගණ හතෙහි සාපේක්ෂිත වශයෙන් සුළු වැඩිවීම් වාර්තා වී ඇති අතර, කර්මාන්ත ගණ දෙකක නිමැවුම් වටිනාකමෙහි පහත වැටීමක් වාර්තා වී ඇත. මීට අමතරව කර්මාන්ත උප ගණ 8 ක් මගින් ද 1972 දී සිය වටිනාකම්හි පහත වැටීමක් වාර්තා කර ඇත. ඒවා නම්:—

1. කල් තබාගත හැකි සහ ටින්වල අසුරන ලද පළතුරු, එළවළු, මස්, මාළු සහ වෙනත් මුහුදු ආහාර.
2. විස්කෝතු, කොකෝවා, චොකලට් සහ සීනි රසකැවිලි.
3. පාන වර්ග.
4. ගොතන ලද ඇඳුම් පැළඳුම්.
5. වීදුරු සහ වීදුරු නිෂ්පාදිතයන්,
6. ගඩොල් සහ උළු.
7. සකස් කරන ලද ලෝහ භාණ්ඩ.
8. ඉල්මනයිට් නිෂ්පාදන.

මෙම කර්මාන්තයන් මගින් වාර්තා කර ඇති නිමැවුම් වටිනාකමේ පහළ වැටීම සැලකිය යුතු නොවන මුත්, අනෙකුත් කර්මාන්ත බොහොමයක් මගින් වාර්තා කර ඇති ආන්තික වැඩිවීම සහ 1972 දී දක්නට ලැබුණු මිල ඉහළ යාම එක්ව සලකන කළ, කර්මාන්තයේ සමස්ථ ක්‍රියාකාරිත්වය සතුටුදායක වී නැත.

### 4. කර්මාන්ත ව්‍යුහය

ලබා ගත හැකි විදේශ විනිමය ප්‍රමාණය, දේශීය වෙළෙඳ පලෙහි ස්වභාවය හා ප්‍රමාණය ශ්‍රී ලංකාවේ කර්මාන්ත ව්‍යුහය කෙරෙහි බොහෝ දුරට බලපා ඇත.

හැට ගණන් වලදී ඇති කරන ලදුව. පසුව වඩාත් දැඩි කරන ලද ආනයන සහ ගෙවීම් පාලනයන් හමුවේ ශ්‍රී ලංකාවේ නිෂ්පාදන කර්මාන්තයේ සැලකිය යුතු වැඩි දියුණුවක් දක්වීය. පාරිභෝගික භාණ්ඩ නිෂ්පාදන කර්මාන්ත පසුගිය දශකය තුළදී ප්‍රධාන තැන ගත් කාර්මික ගණය විය. මුළු නිෂ්පාදනයෙහිලා එයට ඇති කොටස ආන්තික වශයෙන් උච්චාවචනය වෙමින් පැවතුනද 1972 දී පිරිහීමට පත්වී නොමැත. මෙම ගණය සිය කොටස 1971 දී පැවැති සියයට 49 9 සිට 1972 දී සියයට 51·8 දක්වා වැඩි කර ගනු ලැබීය.

## II (ආ) 3 සංඛ්‍යා සටහන

## 1971/1972 වර්ෂයන් දෙක සඳහා පිළිතුරු සැපයූ ඒකකයන්හි කාර්මික නිෂ්පාදන වටිනාකම

| කාර්මික ගණය | සම්ාගම් ගණන | නිෂ්පාදනය (රු. ද. ලක්ෂ) 1971 | 1972 | සියයට ගණනේ වෙනස |
|---|---|---|---|---|
| 1. ආහාර පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදනය | 177 | 595·1 | 618·2 | + 3·9 |
| (අ) සැකසූ ආහාර .. .. | 88 | 209·5 | 262·3 | + 25·2 |
| (ආ) එළවළු තෙල් වර්ග සහ මේද .. | 1 | 174·2 | 143·9 | − 17·4 |
| (ඇ) කල්තබාගත හැකි සහ ටින්වල අසුරන ලද පළතුරු එළවළු, මස්, මාළු සහ අනෙකුත් මුහුදු ආහාර .. .. | 27 | 20·9 | 9·8 | − 53·1 |
| (ඇ) බිස්කෝතු, කොකෝවා, චොකලට් සහ සීනි රස කැවිලි .. .. | 39 | 49·4 | 49·7 | + 0·6 |
| (ඉ) පාන වර්ග .. .. | 13 | 25·2 | 20·8 | − 17·5 |
| (ඊ) ස්ප්‍රීතු .. .. .. | − | — | — | — |
| (උ) දුම්කොළ .. .. | 9 | 115·9 | 131·7 | + 13·6 |
| 2. රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම්භාණ්ඩ කර්මාන්ත | 308 | 287·9 | 335·7 | + 16·6 |
| (අ) ගොතන ලද ඇඳුම් පැළඳුම්, මැසූ ඇඳුම් සහ අනෙකුත් ආයිත්තම් (පාවහන් හැර) .. | 180 | 58 1 | 57·6 | − 0·9 |
| (ආ) නූල් කැටීම, රෙදිපිළි විවීම සහ නිම කිරීම .. | 89 | 185·0 | 226·5 | + 22·4 |
| (ඇ) පාවහන් සහ සම් නිෂ්පාදිතයන් .. | 39 | 44·8 | 51·6 | + 15·2 |
| 3. දැව සහ දැව භාණ්ඩ නිෂ්පාදනය ගෘහ භාණ්ඩ ඇතුළුව) | 11 | 23·3 | 30·7 | + 31·8 |
| (අ) දැව නිෂ්පාදිත .. .. | 10 | 9·5 | 12·7 | + 33·7 |
| (ආ) තුනී ලෑලි .. . | 1 | 13·8 | 18·0 | + 30·4 |
| 4. කඩදාසි සහ කඩදාසි භාණ්ඩ | 41 | 51·1 | 68·3 | + 33·7 |
| 5. රසායනික, පෙට්‍රෝලියම්, ගල් අඟුරු, රබර් සහ ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදනය | 142 | 470 1 | 537·0 | + 22·5 |
| (අ) කාර්මික රසායන ද්‍රව්‍ය .. .. | 1 | 3·3 | 5·2 | + 57·6 |
| (ආ) විවිධ රසායනික නිෂ්පාදිතයන් .. | 93 | 158·9 | 189·8 | + 19·4 |
| (ඇ) පෙට්‍රෝලියම් සහ ගල් අඟුරු නිෂ්පාදිතයන් .. | 2 | 198·5 | 259 5 | + 30·7 |
| (ඇ) රබර් නිෂ්පාදිතයන් .. ., | 31 | 60·7 | 64·7 | + 6·5 |
| (ඉ) ප්ලාස්ටික් නිෂ්පාදිතයන් .. .. | 15 | 17·7 | 17·8 | + 0·6 |
| 6. ලෝහ නොවන ඛනිජ භාණ්ඩ නිෂ්පාදනය (පෙට්‍රෝලියම් සහ ගල් අඟුරු හැර) | 42 | 175·2 | 166·9 | − 4·7 |
| (අ) පිඟන් බඩු .. . | 1 | 8·5 | 12·9 | + 51·8 |
| (ආ) වීදුරු සහ වීදුරු නිෂ්පාදිතයන් .. | 14 | 13·9 | 10·8 | − 22·3 |
| (ඇ) සිමෙන්ති සිමෙන්ති නිෂ්පාදිතයන් සහ ඇස්බැස්ටෝස් නිෂ්පාදිතයන් .. | 12 | 116·5 | 109·7 | − 5·8 |
| (ඈ) ඉල්මනයිට් නිෂ්පාදනය .. .. | 1 | 6·2 | 3·7 | − 40·3 |
| (ඉ) ගඩොල් සහ උළු .. .. | 14 | 30·1 | 29·8 | − 1·0 |
| 7. මූලික ලෝහ භාණ්ඩ | 1 | 58·6 | 67·5 | + 15·2 |
| (අ) යකඩ සහ වානේ මූලික කර්මාන්ත .. | 1 | 58·6 | 67·5 | + 15·2 |
| 8. සකස්කරන ලද ලෝහ භාණ්ඩ සහ යන්ත්‍රෝපකරණ නිෂ්පාදනය | 201 | 246 2 | 235·9 | − 4·2 |
| (අ) සකස්කරන ලද ලෝහ භාණ්ඩ (යන්ත්‍රෝපකරණ හැර) .. .. | 109 | 106·4 | 85·3 | − 19·8 |
| (ආ) යන්ත්‍ර සූත්‍ර (විදුලි නොවන යන්ත්‍ර සූත්‍ර) සහ ප්‍රවාහන උපකරණ .. .. | 55 | 56·1 | 61·0 | + 8·7 |
| (ඇ) විදුලි යන්ත්‍ර සූත්‍ර, මෙවලම් උපකරණ හා සැපයුම් .. ., | 37 | 83 7 | 89·6 | + 7·0 |
| 9. නිෂ්පාදිත භාණ්ඩ (අන් තැනක සඳහන් නොවූ) | 36 | 22 2 | 22·9 | + 3·2 |
| එකතුව | 959 | 1,898·0 | 2,083·1 | + 9·8 |

මූලය; ශ්‍රී ලංකා මහ බැංකුව;

## II (ආ) 4 සංඛ්‍යා සටහන

## 1968—72 කාර්මික නිෂ්පාදනයේ වටිනාකම ප්‍රධාන ආර්ථික ගණ අනුව.

| කාර්මික ගණය | රුපියල් දශ ලක්ෂ | | | | | සියයට ගණන | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1968 | 1969 | 1970 | 1971 | 1972 | 1968 | 1969 | 1970 | 1971 | 1972 |
| **අ. පාරිභෝගික භාණ්ඩ ..** | **695·3** | **835·4** | **917·0** | **1101·2** | **1265·0** | **49·7** | **51·3** | **47·2** | **49·9** | **51·8** |
| I. ආහාරපාන හා දුම්කොළ .. | 238·4 | 287·5 | 346·7 | 428 4 | 520·9 | 17·0 | 17·7 | 17·8 | 19·4 | 21·3 |
| අ. සැකසූ ආහාර1 .. | 40·8 | 45 8 | 82·9 | 139·0 | 189·0 | 2·9 | 2·8 | 4·3 | 6·3 | 7·7 |
| ආ. කල්තැබිය හැකි සහ ටින්වල අසුරන ලද පලතුරු, එළවළු, මස්, මාළු සහ අනෙකුත් මුහුදු ආහාර(2) .. | 8·4 | 8·6 | 11·8 | 23·2 | 11·5 | 0·6 | 0·5 | 0·6 | 1·1 | 0·4 |
| ඇ. විස්කෝතු සහ රසකැවිලි .. | 44·3 | 49·9 | 50·5 | 53·1 | 50·2 | 3·2 | 3·1 | 2·5 | 2·4 | 2·1 |
| ඈ. සිසිල් බීම .. | 17·3 | 17·8 | 26·6 | 26·1 | 21·1 | 1·2 | 1·1 | 1·4 | 1·2 | 10·9 |
| ඉ. අරක්කු, බීර යනාදිය .. | 17·1 | 59·5 | 68·3 | 62·1 | 75,4 | 1·2 | 3·7 | 3·5 | 2·8 | 3·1 |
| ඊ. දුම්කොළ .. | 110·5 | 105·9 | 106·6 | 124·9 | 173·7 | 7·9 | 6·5 | 5·5 | 5·6 | 7·1 |
| II. ඇඳුම් පැළඳුම්(3) .. | 55·7 | 56·0 | 64·3 | 70·8 | 66·7 | 4·0 | 3·4 | 3·3 | 3·2 | 2·7 |
| III. පාවහන් සහ සම් භාණ්ඩ .. | 32·4 | 38·9 | 45·1 | 46·0 | 56·6 | 2·3 | 2·4 | 2·3 | 2·1 | 2·3 |
| IV. විවිධ රසායනික භාණ්ඩ (4) .. | 118·9 | 155·6 | 155·9 | 230·3 | 213·5 | 8·5 | 9·6 | 8·0 | 10·4 | 8·7 |
| V. කඩදාසි නිෂ්පාදිතයන් සහ කඩදාසි භාණ්ඩ (5) .. | 19·4 | 13·4 | 13·1 | 18·0 | 40·4 | 1·4 | 0·8 | 0·7 | 0·8 | 1·7 |
| VI සැදූ ලෝහ භාණ්ඩ යන්ත්‍රෝපකරණ හැර (6) .. | 9·1 | 13·1 | 3·4 | 3·6 | 5·0 | 0·7 | 0·8 | 0·2 | 0·2 | 0·2 |
| VII. ප්ලාස්ටික් භාණ්ඩ .. | 32·5 | 28·2 | 32·8 | 37·7 | 17·9 | 2·3 | 1·7 | 1·7 | 1·7 | 0·7 |
| VIII. විදුරු සහ විදුරු භාණ්ඩ . | 4·8 | 7·7 | 8·1 | 13·9 | 11·9 | 0·3 | 0·5 | 0·4 | 0·6 | 0·5 |
| IX. පිඟන් බඩු .. | 8·5 | 8·7 | 8·0 | 8·5 | 12·9 | 0·6 | 0·5 | 0·4 | 0·4 | 0·5 |
| X. රබර් භාණ්ඩ .. | 41·2 | 52·8 | 56·4 | 60·2 | 67·7 | 2·9 | 3·2 | 2·9 | 2·7 | 2·8 |
| XI. වියන ලද හා නිමකරන ලද හා රෙදිපිළි .. | 123·7 | 154 8 | 154·2 | 147·9 | 208·4 | 8·9 | 9·5 | 8·0 | 6·7 | 8·5 |
| XII. ද්‍රව නිෂ්පාදන .. | 8·0 | 9·2 | 10·4 | 12·8 | 12·7 | 0·6 | 0·6 | 0·5 | 0·6 | 0·5 |
| XIII. නිෂ්පාදිත භාණ්ඩ අන් තැනක සඳහන් නොවූ(7) .. | 2·7 | 9·5 | 18·6 | 23·1 | 30·4 | 0·2 | 0·6 | 1·0 | 1·1 | 1·3 |
| **ආ. අන්තර් භාණ්ඩ ..** | **552·8** | **580·8** | **800·3** | **842·8** | **866 6** | **39·5** | **35·7** | **41·1** | **38·2** | **35·5** |
| I ආහාර නිෂ්පාදිතයන් (8) .. | 371·2 | 354·2 | 337·8 | 314·6 | 277·8 | 26·5 | 21·8 | 17·4 | 14·3 | 11·4 |
| II. සැදූ ලෝහ භාණ්ඩ යන්ත්‍රසූත්‍ර සහ ප්‍රවාහණ උපකරණ හැර (9) .. | 70·4 | 68·9 | 93·5 | 124·4 | 106·1 | 5·0 | 4·2 | 4·8 | 5·6 | 4·3 |
| III. කඩදාසි නිෂ්පාදිතයන් සහ කඩදාසි භාණ්ඩ (10) .. | 35·2 | 48·9 | 51·9 | 52·3 | 38·7 | 2·5 | 3·0 | 2·7 | 2·4 | 1·6 |
| IV. නූල් කැටීම (රෙදිපිළි) .. | 12·5 | 17·4 | 19·1 | 41·5 | 62·8 | 0·9 | 1·1 | 0·9 | 1·9 | 2·6 |
| V. තුනී ලෑලි .. | 8·9 | 8·8 | 10·8 | 13·8 | 18·0 | 0·6 | 0·5 | 0·6 | 0·6 | 0·7 |
| VI. ඉල්මනයිට් නිෂ්පාදිතයන් .. | 2·2 | 3·1 | 4·7 | 6·2 | 3·7 | 0·2 | 0·2 | 0·2 | 0·3 | 0·2 |
| VII. කාර්මික රසායන (11) .. | 2·3 | 2·2 | 3·1 | 3·3 | 5·2 | 0·2 | 0·1 | 0·2 | 0·1 | 0·2 |
| VIII. විදුලි යන්ත්‍ර සූත්‍ර, මෙවලම්, උපකරණ සහ සැපයුම් .. | 41·8 | 66·3 | 88·4 | 88·2 | 94·8 | 3·0 | 4·1 | 4·5 | 4·0 | 3·9 |
| IX. පෙට්‍රෝලියම් සහ ගල් අඟුරු නිෂ්පාදිතයන් .. | 8·3 | 11·0 | 191·0 | 198·5 | 259·5 | 0·6 | 0 7 | 9·8 | 9·0 | 10·6 |
| **ඇ. ආයෝජන භාණ්ඩ ..** | **150·5** | **210·5** | **227·7** | **263·7** | **310 8** | **10·8** | **13·0** | **11·7** | **11·9** | **12·7** |
| I. සිමෙන්ති, සිමෙන්ති නිෂ්පාදිතයන් සහ ඇස්බැස්ටෝස් නිෂ්පාදිතයන් .. | 70·0 | 89·0 | 104·8 | 116·7 | 110·4 | 5·0 | 5·5 | 5·4 | 5·3 | 4·5 |
| II. යන්ත්‍ර සූත්‍ර (විදුලි යන්ත්‍ර හැර) සහ ප්‍රවාහණ උපකරණ .. | 45·9 | 77 9 | 70·8 | 57·3 | 98·9 | 3·3 | 4·8 | 3·6 | 2·6 | 4·0 |
| III. ගඩොල් සහ උළු .. | 7·3 | 14·8 | 13·2 | 31·1 | 34·0 | 0·5 | 0·9 | 0·7 | 1·4 | 1·4 |
| IV. යකඩ සහ වානේමූලික කර්මාන්ත (12) . | 27·3 | 28·8 | 38·9 | 58·6 | 67·5 | 2·0 | 1·8 | 2·0 | 2·6 | 2·8 |
| **එකතුව** | **1,398.6** | **1,626,7** | **1,945.0** | **2,207.7** | **2,442.4** | **100·0** | **100·0** | **100·0** | **100·0** | **100·0** |

මූලය; ශ්‍රී ලංකා මහ බැංකුව.

1. කිරි නිෂ්පාදන, අයිස් ක්‍රීම් සහ ලුණු යනාදිය
2. ජෑම් වර්ග, ජෙලි වර්ග, සෝස් වර්ග, පලතුරු කෝඩියල් යනාදිය
3, කමිස බැනියම් යනාදිය
4. භෛෂජ්‍ය ද්‍රව්‍ය, අංගරාජ, සබන් සහ පවිත්‍ර කිරීමේ සංයෝග, ගිනි පෙට්ටි, දන්තාලේප යනාදිය
5. ලියන කඩදාසි. අභ්‍යාස පොත් යනාදිය
6. ඇලුමිනියම් භාණ්ඩ
7. බුරුසු, ගල්ලෑලි, මුද්‍රණ, බ්ලොක්, සෙල්ලම් බඩු හා සංගීත භාණ්ඩ යනාදිය
8 ගව සහ කුකුල් ආහාර එළවළු තෙල් වර්ග, අයිස් කපාපු පොල් යනාදිය
9· භාජන, කටු කම්බි කම්බි ඇණ, ගැල්වනයිස් භාණ්ඩ යනාදිය
10. මුද්‍රණ කඩදාසි, කාඩ් න් අනිකුත් ඇසුරුම් පෙට්ටි සහ ඔතන කඩදාසි
11. කෝස්ටික් සෝඩා සහ ක්ලෝරීන්
12. රෝල් සහ කම්බි භාණ්ඩ

කර්මාන්ත භාණ්ඩ හිඟයන් සහිත දේශීය වෙළෙඳ පොළ පාරිභෝගික භාණ්ඩ නිපදවන්නාන්ට ඉමහත් අනුබලයක් විය. පාරිභෝගික භාණ්ඩ නිෂ්පාදන වටිනාකමෙහි වැඩිවීම අනුව දක්වා ඇති අනුකූලතාවයේ ස්වභාවය මිනිය හැකිය. 1968 සිට 1972 දක්වා ප්‍රධාන ආර්ථික ගණ අනුව වර්ග කළ කාර්මික නිෂ්පාදන දත්තයන් II (ආ) 4 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත. 1968 දී නිෂ්පාදනය කළ පාරිභෝගික භාණ්ඩ මුළු වටිනාකම රුපියල් දශලක්ෂ 695·3 ක් වන අතර 1972 දී එය රුපියල් දශලක්ෂ 1265·0 ක් විය. පාරිභෝගික භාණ්ඩ ගණයේ, ආහාර, පාන වර්ග සහ දුම්කොළ ඉතා සීඝ්‍රයෙන් වර්ධනය වූ ඒවාවන අතර, 1968 සහ 1972 අතර දී එහිනිෂ්පාදනය දෙගුණයකටත් වඩා වැඩි කර ගෙන ඇත. පරිභෝජන ක්ෂේත්‍රයෙහි වේගයෙන් වර්ධනය වන තවත් ගණයක් වනුයේ විවිධ රසායනික වන අතර, එම කාලය තුළ එහි නිමැවුම දෙගුණයක් පමණ විය.

මුළු නිෂ්පාදන වටිනාකමේ අන්තර් භාණ්ඩ වලට හිමි කොටස 1971 දී වූ සියයට 38·2 සිට 1972 දී සියයට 35·5 දක්වා පහත වැටිණි. මෙකී කර්මාන්ත කාර්ය ක්ෂේත්‍රයට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ඇතුල් වීමෙන් මෙකී ගණයට සැලකිය යුතු ස්ථාවරත්වයක් ලැබී ඇත. එහි ඛනිජ තෙල් සහ ගල් අඟුරු නිෂ්පාදිත වල නිමැවුම 1968 සහ 1972 අතර කාලයේදී පිළිවෙලින් රුපියල් දශලක්ෂ 8·3 සිට රුපියල් දශලක්ෂ 259·5 දක්වා තියුණු අන්දමින් ඉහළ ගොස් ඇත.

## II (ආ) 5 සංඛ්‍යා සටහන

## 1972 නිෂ්පාදන සමාගම් විශාලත්වය අනුව බෙදීගිය අයුරු නිමැවුම් වටිනාකම පදනම් කොට

| කාර්මික ගණය | | නිමැවුම් වටිනාකම | | | |
|---|---|---|---|---|---|
| | | රුපියල් 250 දහසට අඩු | රු. 250 දහසේ සිට රු. දශලක්ෂ 2 දක්වා | රු. දශලක්ෂ 2 ට වැඩි | එකතුව |
| I· ආහාර පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත | සමාගම් ගණන | 235 | 43 | 26 | 304 |
| | නිමැවුමේ % ගණන | 30·6 | 3·8 | 65·6 | 100·0 |
| II· රෙදි පිළි, ඇඳුම් පැළඳුම් සහ සම්භාණ්ඩ කර්මාන්ත | සමාගම් ගණන | 521 | 82 | 36 | 639 |
| | නිමැවුමේ % ගණන | 6·9 | 13·1 | 80·0 | 100·0 |
| III· දව සහ දව භාණ්ඩ (ගෘහ භාණ්ඩ ඇතුළුව) | සමාගම් ගණන | 5 | 4 | 2 | 11 |
| | නිමැවුමේ % ගණන | 2·2 | 13·7 | 84·1 | 100·0 |
| IV· කඩදාසි සහ කඩදාසි භාණ්ඩ නිෂ්පාදිත | සමාගම් ගණන | 44 | 15 | 8 | 67 |
| | නිමැවුමේ % ගණන | 3·9 | 14·8 | 81·3 | 100·0 |
| V· රසායන ද්‍රව්‍ය, ඛනිජ තෙල්, ගල් අඟුරු, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | සමාගම් ගණන | 109 | 58 | 29 | 196 |
| | නිමැවුමේ % ගණන | 1·4 | 6·8 | 91·8 | 100·0 |
| VI· ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිතයන් (පෙට්‍රෝලියම් සහ ගල් අඟුරු හැර) | සමාගම් ගණන | 36 | 19 | 9 | 64 |
| | නිමැවුමේ % ගණන | 1·9 | 7·8 | 90·3 | 100·0 |
| VII· මූලික ලෝහ නිෂ්පාදිතයන් | සමාගම් ගණන | — | — | 1 | 1 |
| | නිමැවුමේ % ගණන | — | — | 100·0 | 100·0 |
| VIII· සකස් කළ ලෝහ භාණ්ඩ, යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ නිෂ්පාදිතයන් | සමාගම් ගණන | 132 | 104 | 44 | 280 |
| | නිමැවුමේ % ගණන | 3·2 | 21·7 | 75·1 | 100·0 |
| IX· නිෂ්පාදිත භාණ්ඩ (අන් තැනක සඳහන් නොවන) | සමාගම් ගණන | 40 | 20 | 4 | 64 |
| | නිමැවුමේ % ගණන | 10·0 | 42·2 | 47·8 | 100·0 |
| එකතුව | සමාගම් ගණන | 1,122 | 345 | 159 | 1,626 |
| | නිමැවුමේ % ගණන | 12·3 | 9·4 | 78·3 | 100·0 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

ආයෝජන භාණ්ඩ නිෂ්පාදනය කරන කර්මාන්තයන්හි නිමැවුම 1968 - 1972 කාලච්ඡේදයේදී දෙගුණයකටත් වඩා වැඩිවී ඇත. එසේ වුවද, කර්මාන්ත නිෂ්පාදනයේ මුළු වටිනාකමෙහි ඊට හිමි සාපේක්ෂක කොටස බොහෝ දුරට ස්ථාවරවම පැවතිණි. අන්තර් හා ආයෝජන භාණ්ඩ නිෂ්පාදනය කෙරෙහි ඉතා තදින් නැඹුරු වන අන්දමින් සිය ආයෝජනයන් කර ඇති රාජ්‍ය ව්‍යවසායන් නිෂ්පාදන ක්ෂේත්‍රයට ඇතුළුවීම ශ්‍රී ලංකාවේ කාර්මික ව්‍යුහය කෙරෙහි වැඩි සමතුලිතතාවයක් ඇති කිරීමට හේතු වී ඇත.

නිමැවුම් වටිනාකම පදනම් කොට කාර්මික ඒකකයන් ගේ ප්‍රමාණයන් බෙදී යාම පිළිබඳ දත්තයන් II (ආ) 5 සංඛ්‍යා සටහනේ දක්වා ඇත. කාර්මික නිෂ්පාදනය සියළුම අංශයන්හි ඒකක කිහිපයක ඉතා තදින් සංකේන්ද්‍රණය වී තිබෙන බව මෙම සටහනින් පැහැදිලි කෙරේ.

මෙම සංකේන්ද්‍රණය මැනවින් කැපී පෙනෙනුයේ මූලික ලෝහ නිෂ්පාදනය, රසායනික නිෂ්පාදනය, ඛනිජ තෙල්, ගල් අඟුරු, රබර් සහ ප්ලාස්ටික් භාණ්ඩ හා ලෝහ නොවන ඛනිජ ද්‍රව්‍ය (ඛනිජ තෙල් හා ගල් අඟුරු හැර) යන කාර්මික ගණ වලය. වෙනත් තැනක සඳහන් කොට නොමැති නිෂ්පාදිත සහ ආහාර, පාන වර්ග සහ දුම්කොළ කාර්මික ගණයන්හි සංකේන්ද්‍ර වීම අඩු ප්‍රමාණයකින් සිදුවී ඇත.

5. සේවා නියුක්තිය සහ වැටුප්

1972 දී සේවා නියුක්ත මුළු සංඛ්‍යාවෙහි සැලකිය යුතු වැඩිවීමක් සිදු වී ඇති අතර, 1971 දී වූ 110141 සිට 123986 දක්වා සියයට 12·6 කින් එය ඉහළ ගියේය. මෙකී වැඩිවීම ඇතිවී තිබෙන්නේ කාර්මික ගණ දෙකකය. එනම් රෙදිපිළි, ඇඳුම් පැළඳුම් හා සම් භාණ්ඩ සහ සකස් කළ වානේ නිෂ්පාදිත නිෂ්පාදනය කරනු ලබන කර්මාන්ත, යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහන උපකරණය. මෙම කාර්මික ගණ දෙක සිය සේවක සංඛ්‍යාව 22568 සිට 32908 දක්වාත්, 15089 සිට 21483 දක්වාත් පිළිවෙලින් සියයට 46·2 කින් හා සියයට 42·3 කින් වැඩි කර ගන්නා ලදි. රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ හම් කර්මාන්ත කාර්මික ගණ විශාලතම සේවා යෝජකයා වූ අතර මුළු කර්මාන්ත සේවක සංඛ්‍යාවෙන් සියයට 26·5 ගණනය කරන ලදී. කාර්මික අංශයෙහි නියුතු වූ ශ්‍රම දින ගණන් මුළු ප්‍රමාණය 26232 සිට 31610 දක්වා වැඩිවීමක් දක්වා ඇති අතර එය සියයට 20·5 ක වැඩිවීමකි.

1972 දී ගෙවන ලද මුළු වැටුප් බිල තියුණු අන්දමින් ඉහළ ගිය අතර, එම වැඩිවීම සියයට 31·4 ක් තරම් විය. වැටුප් බිල වැඩිවූ ප්‍රධාන කාර්මික ගණයන් නම් රෙදිපිළි, ඇඳුම් පැළඳුම් හා හම් නිෂ්පාදන සහ ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත (ඛනිජ තෙල් හා ගල් අඟුරු හැර) වන අතර, ඒවායේ වැටුප් බිල පිළිවෙලින් සියයට 68·3 කින් සහ සියයට 45·0 කින් වැඩිවිය. කර්මාන්ත සමස්ථයක් වශයෙන් ගත් කළ ඒක ශ්‍රම දිනක වැටුප 1971 දී වූ රුපියල් 10·67 සිට රුපියල් 11·63 දක්වා වැඩි විය. රසායනික, ඛනිජ තෙල්, ගල් අඟුරු සහ ප්ලාස්ටික් නිෂ්පාදිත කාර්මික ගණය ඉහළම ඒක ශ්‍රම දිනක වැටුප දක් වූ අතර, ඒක ශ්‍රම දිනක සාමාන්‍ය වැටුප රුපියල් 18·36 ක් විය. අවම ප්‍රමාණය වූ රුපියල් 8·20 ක ඒක ශ්‍රම දිනක වැටුප දක්නට ලැබුනේ වෙනත් තැනක නොසඳහන් නිෂ්පාදිත ගණයෙහිය.

වැටුප් බිල පදනම්ව කර්මාන්ත ඒකකයන්හි ප්‍රමාණය අනුව බෙදී යාමට අදළ දත්තයන්, II (ආ) 6 වන සටහනෙහි දක්වා ඇත. සේවා නියුක්තිය සහ වැටුප් විශාල කර්මාන්ත ඒකකයන්හි අධික ලෙස සංකේන්ද්‍රණය වී ඇති බව ඉතා පැහැදිලිව මෙම සංඛ්‍යා සටහනින් පෙන්නුම් කරයි. මෙම සංකේන්ද්‍රණය වඩාත් කැපී පෙනෙනුයේ ලෝහ නොවන ඛනිජ නිෂ්පාදන (ඛනිජ තෙල් සහ ගල් අඟුරු හැර) සහ රසායන, ඛනිජ තෙල්, ගල් අඟුරු, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන කර්මාන්ත ඇතුළත් කර්මාන්ත ගණයෙහි ය. ඉහළ ප්‍රමාණයක සංකේන්ද්‍රණයක් නොදක්වන එකම කර්මාන්ත ගණය ආහාර, පාන වර්ග සහ දුම්කොළ ය.

## II (ආ) 6 සංඛ්‍යා සටහන

## 1972 නිෂ්පාදන සමාගම්, විශාලත්වය අනුව බෙදී ගිය අයුරු-වැටුප් පිරිවැය පදනම් කොට

| කාර්මික ගණය | | රුපි. 15 දහසට අඩු | රුපි. 15 දහස — 50 දහසට අඩු | රුපි. 50 දහස— 500 දහසට අඩු | රුපි. 500 දහස සහ වැඩි | එකතුව |
|---|---|---|---|---|---|---|
| I. ආහාර පාන සහ දුම්කොළ නිෂ්පාදිත .. .. .. | සමාගම් ගණන .. | 191 | 56 | 36 | 18 | 301* |
| | වැටුප් බිලේ % ගණන .. | 14·2 | 1·9 | 6·7 | 77·2 | 100·0 |
| II. රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් භාණ්ඩ කර්මාන්ත .. | සමාගම් ගණන .. | 422 | 115 | 85 | 17 | 639 |
| | වැටුප් බිලේ % ගණන .. | 3·2 | 4·2 | 14·2 | 78·4 | 100·0 |
| III. දව සහ දව භාණ්ඩ (ගෘහ භාණ්ඩ ඇතුළුව) .. .. | සමාගම් ගණන .. | — | 6 | 3 | 2 | 11 |
| | වැටුප් බිලේ % ගණන .. | — | 1·2 | 5·1 | 93·7 | 100·0 |
| IV. කඩදාසි සහ කඩදාසි භාණ්ඩ නිෂ්පාදිත .. .. | සමාගම් ගණන .. | 31 | 16 | 16 | 4 | 67 |
| | වැටුප් බිලේ % ගණන .. | 1·8 | 3·3 | 17·0 | 77·9 | 100·0 |
| V. රසායන ද්‍රව්‍ය, ඛනිජ තෙල්, ගල් අඟුරු, රබර් සහ ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදිත .. .. .. | සමාගම් ගණන .. | 78 | 44 | 51 | 23 | 196 |
| | වැටුප් බිලේ % ගණන .. | 0·6 | 1·6 | 8·9 | 88·9 | 100· |
| VI. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිතයන් (පෙට්‍රෝලියම් සහ ගල් අඟුරු හැර) .. .. .. .. | සමාගම් ගණන .. | 17 | 14 | 23 | 10 | 64 |
| | වැටුප් බිලේ % ගණන .. | 0·3 | 1·1 | 8·0 | 90·6 | 100·0 |
| VII. මූලික ලෝහ නිෂ්පාදිතයන් .. .. .. | සමාගම් ගණන .. | — | — | — | 1 | 1 |
| | වැටුප් බිලේ % ගණන .. | — | — | — | 100·0 | 100·0 |
| VIII. සකස් කළ ලෝහ භාණ්ඩ, යන්ත්‍ර සහ ප්‍රවාහන උපකරණ නිෂ්පාදිත .. .. .. | සමාගම් ගණන .. | 67 | 74 | 111 | 28 | 280 |
| | වැටුප් බිලේ % ගණන .. | 0·9 | 4·1 | 32·8 | 62·2 | 100·0 |
| IX. නිෂ්පාදිත භාණ්ඩ (අන්තැනක නොසඳහන්) .. .. | සමාගම් ගණන .. | 25 | 17 | 20 | 2 | 64 |
| | වැටුප් බිලේ % ගණන .. | 3·3 | 9·3 | 57·3 | 30·1 | 100·0 |
| **එකතුව** .. .. .. | සමාගම් ගණන .. | 831 | 342 | 345 | 105 | 1,623* |
| | වැටුප් බිලේ % ගණන .. | 4·2 | 2·6 | 13·8 | 79·4 | 100·0 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

* බීර හා ස්ටවුට් වලට අදාල වැටුප් ලැබී ඇත්තේ ආයතන දෙකක් සම්බන්ධයෙන් පමණි.

## නිෂ්පාදනය අමු ද්‍රව්‍ය සහ

| කාර්මික ගණය | | ව්‍යාපාරික ආයතන | නිෂ්පාදනය රුපියල් දශලක්ෂ |
|---|---|---|---|
| | | 1 | 2 |
| I. | ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත .. | 148 | 427·4 |
| II. | රෙදිපිළි, ඇඳුම් පැලඳුම් සහ සම්භාණ්ඩ කර්මාන්ත .. | 543 | 302·7 |
| III. | දැව සහ දැව භාණ්ඩ(ගෘහ භාණ්ඩ ඇතුළුව) .. | 5 | 19·4 |
| IV. | කඩදාසි සහකඩදාසි භාණ්ඩ නිෂ්පාදිත .. | 58 | 73·3 |
| V. | රසායන ද්‍රව්‍ය, ඛනිජ තෙල්, පෙට්‍රෝලියම් ගල් අඟුරු රබර් සහ ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදිත .. | 155 | 526·0 |
| VI. | ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිතයන් (පෙට්‍රෝලියම් සහ ගල් අඟුරු හැර) .. | 56 | 149·7 |
| VII. | මූලික ලෝහ නිෂ්පාදිතයන් .. | 1 | 67·5 |
| VIII. | සකස් කළ ලෝහ භාණ්ඩ, යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ නිෂ්පාදිත .. | 183 | 199·0 |
| IX. | නිෂ්පාදිත භාණ්ඩ (අන්තැනක නොසඳහන්) .. | 39 | 12·2 |
| | එකතුව .. | 1,188 | 1,777·2 |

II (අං) 7 සංඛ්‍යා සටහන

අපනයන — 1972

| අමු ද්‍රව්‍ය | | | | අපනයන | |
|---|---|---|---|---|---|
| දේශීය | | විදේශීය | | | |
| මුළු වටිනාකම රුපියල් දහස් ගණනින් | වටිනාකම රුපියල් දහස් ගණනින් | වටිනාකම රුපියල් දහස් ගණනින් | සියයට ගණන | වටිනාකම රුපියල් දහස් ගණනින් | 7, 5 හේ සියයට ගණන වශයෙන් |
| 3 | 4 | 5 | 6 | 7 | 8 |
| 233,611 | 69,033 | 164,578 | 70·4 | 16,892 | 10·3 |
| 136,992 | 42,671 | 94,231 | 68·8 | 7,722 | 5·6 |
| 17,504 | 16,126 | 1,378 | 7·9 | 1,138 | 82·6 |
| 44,229 | 11,957 | 32,272 | 73·0 | 128 | 0·4 |
| 355,982 | 27,796 | 328,186 | 92·2 | 71,343 | 21·7 |
| 54,675 | 35,763 | 18,912 | 34·6 | 11,742 | 62·1 |
| 49,028 | 1,890 | 47,138 | 96·1 | — | — |
| 122,042 | 22,092 | 99,950 | 81·9 | 7,223 | 7·2 |
| 6,233 | 1,113 | 5,120 | 82·1 | — | — |
| 1,620,296 | 228,531 | 791,765 | 77·6 | 116,188 | 14·6 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

**6. අමු ද්‍රව්‍ය භාවිතය**

නිෂ්පාදන පිරිවැයෙන් සියයට 50 කට වැඩි ප්‍රමාණයක් සමන්විත වී ඇත්තේ අමු ද්‍රව්‍යවල වටිනාකමෙන් බව II (ආ) 7 සටහනෙන් දක්වේ. අමු ද්‍රව්‍ය වටිනාකමෙන් සියයට 77 ක්ම ආනයන අමු ද්‍රව්‍ය විසින් ගණනය කරන ලදී.

ආනයන කළ අමු ද්‍රව්‍ය සාපේක්ෂිත වශයෙන් අඩුවෙන් උපයෝජනය කරන ලද්දේ කර්මාන්ත ගණ දෙකක් මගින් පමණකි. ඒවානම් ගෘහ භාණ්ඩ ඇතුළුව දව සහ දව භාණ්ඩ හා ලෝහ නොවන ඛනිජ නිෂ්පාදන (ඛනිජ තෙල් සහ ගල් අඟුරු හැර) විය. අමු ද්‍රව්‍යවල මුළු වටිනාකමෙන් සියයට 7 . 9 ක් සහ 34 . 6 ක් මෙම කර්මාන්ත දෙක සඳහා ආනයන කළ අමු ද්‍රව්‍ය මගින් ගණනය කරන ලදී. සිය අමු ද්‍රව්‍ය වටිනාකම් වලින් සියයට 80 කට වැඩි යෙන් කර්මාන්ත ගණ හතරක් මගින් ආනයනය කරන ලදී. ඒවා නම්:-

1. මූලික ලෝහ නිෂ්පාදිත (සියයට 96.1).
2. රසායන, ඛනිජ තෙල්, ගල් අඟුරු, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන (සියයට 92.2)
3. වෙනත් තැනක නොසඳහන් නිෂ්පාදිත (සියයට 82·1).
4. සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍රෝපකරණ හා ප්‍රවාහන උපකරණ (සියයට 81.9).

ආහාර, පාන වර්ග හා දුම්කොළ කර්මාන්ත ගණය ආනයන කළ අමු ද්‍රව්‍ය මත රඳා පැව තීම, උප ගණ සහ නිෂ්පාදිත අනුව වෙනස් වේ. මේ අතර එළවළු තෙල් හා මේද සහ දුම්කොළ වල ආනයනයන් අඩංගු වී ඇත්තේ මඳ වශයෙනි. නැතහොත් ඇත්තේම නැත. සීනි රස කැවිලි සහ විස්කෝතු වැනි අනෙක් ඒවා බොහෝ සෙයින්ම රඳා තිබෙනුයේ ආනයන යෙදුම් මතය· ප්‍රධාන කර්මාන්ත ගණ මගින් උපයන ලද විදේශීය විනිමය ප්‍රමාණයන්ද II (ආ) 7 සංඛ්‍යා සටහනේ දක්වෙයි· රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, ගල් අඟුරු, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත කර්මාන්ත ගණය අධිකතම විදේශීය විනිමය ඉපැයීම් දක්වන අතර, එහි වූ රුපියල් දශ ලක්ෂ 71.3 ක විදේශීය විනිමය ලැබීම් සිය අමු ද්‍රව්‍ය වල විදේශීය විනිමය වටිනාකමෙන් සියයට 21.7 ක් විය. සැලකිය යුතු ප්‍රමාණයකින් විදේශීය විනිමය ඉපයූ අනෙක් කර්මාන්ත ගණ නම් ආහාර, පාන වර්ග සහ දුම්කොළ සහ ලෝහ නොවන ඛනිජ නිෂ්පාදන (ඛනිජ තෙල් සහ ගල් අඟුරු හැර) වෙයි ඒවායේ අපනයන ලැබීම් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 16.9 ක් සහ රුපියල් දශලක්ෂ 11.7 ක් විය.

**7. බල හා ඉන්ධන පරිභරණය**

බල හා ඉන්ධන පරිභරණය කොට ඇති අන්දම, 11 (ආ) 8 සටහනේ දක්වෙයි.

1972 දී නිෂ්පාදන කර්මාන්ත මගින් පරිභරණය කරන ලද ඉන්ධන සහ බලයෙහි වටිනා කමේ එකතුව රුපියල් දශලක්ෂ 51.8 ක් වූ අතර, 1971 දී එය රුපියල් දශලක්ෂ 44.9 ක් වීමේ හේතුවෙන් රුපියල් දශලක්ෂ 6 9 ක ඉහළ යාමක් සිදුවී ඇත. 1972 දී නිෂ්පාදන වටිනා කමෙන් සියයට 5 ක් වැය වූයේ ඉන්ධන සහ බලයේ මිළ සඳහා වන අතර 1971 දී මුළු වටිනා කමෙන් එහි වූ සාපේක්ෂක කොටස සියයට 3 ක් විය. විදුලිය, පෙට්‍රල් සහ තෙල් ප්‍රධාන බල මූලාශ්‍රය වූ අතර, ඒවා විසින් පාරිභෝජනය කළ බල සහ ඉන්ධන කොටස් පිළිවෙලින් සියයට 44.9 ක් සහ සියයට 35.7 ක් විය. 1971 හා සසඳන විට 1972 දී කර්මාන්ත මගින් බල සහ ඉන්ධන පිළිබඳව සිදු කළ උපයෝජනයෙහි සැළකිය යුතු වෙනසක් සිදුවී නොමැත.

## II (අ) 8 සංඛ්‍යා සටහන

## නිෂ්පාදනය බල සහ ඉන්ධන — 1972

| කාර්මික ගණය | සමාගම් ගණන | නිෂ්පාදනය (රුපියල් දශලක්ෂ) | පාවිච්චි කළ ඉන්ධන (රුපියල් දහස් ගණනින්) | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | විදුලි බලය | ගල් අඟුරු සහ ගෑස් | පැට්‍රෝල් සහ තෙල් | අනෙකුත් | එකතුව |
| I. ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත .. | 77 | 128·7 | 1,787 | 29 | 1,218 | 408 | 3,442 |
| II. රෙදිපිළි, ඇඳුම් පැලඳුම් සහ සම්භාණ්ඩ කර්මාන්තය .. | 306 | 251·7 | 4,987 | 168 | 2,068 | 144 | 7,367 |
| III. දැව සහ දැව භාණ්ඩ (ගෘහ භාණ්ඩ ඇතුළුව) .. | 2 | 2·1 | 193 | 76 | 50 | 19 | 338 |
| IV කඩදාසි සහ කඩදාසි භාණ්ඩ නිෂ්පාදිත .. | 47 | 36·8 | 135 | – | 24 | 6,283 | 6,442 |
| V. රසායන ද්‍රව්‍ය, පෙට්‍රෝලියම්, ගල් අඟුරු, රබර් සහ ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදිත . | 92 | 194·2 | 6,807 | 1,002 | 2184 | 473 | 10,466 |
| VI. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිතයන් (පෙට්‍රෝලියම් සහ ගල් අඟුරු හැර) .. | 45 | 128·6 | 5,878 | 27 | 10,768 | 648 | 17,321 |
| VII. මූලික ලෝහ නිෂ්පාදිතයන් .. | 1 | 67·5 | 1,982 | – | 1,091 | – | 3,073 |
| VIII. සකස් කළ ලෝහ භාණ්ඩ, යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ නිෂ්පාදිත .. | 166 | 196·9 | 1,349 | 442 | 1,056 | 323 | 3,170 |
| IX. නිෂ්පාදිත භාණ්ඩ (අන් තැනක සඳහන් නොවන) | 26 | 10·5 | 158 | 4 | 48 | 1 | 211 |
| එකතුව .. | 762 | 1,016·0 | 23,276 | 1,748 | 18,507 | 8,299 | 51,830 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

## පළාත් අනුව කර්මාන්තයින් ගි

| කාර්මික ගණය | බස්නාහිර පළාත | | | මධ්‍යම පළාත | | | දකුණු පළාත | | | උතුරු පළාත | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | නිෂ්පාදනය | | | නිෂ්පාදනය | | | නිෂ්පාඅනය | | | නිෂ්පාදනය | |
| | ආයතන සංඛ්‍යාව | වටිනාකම රු. දහස් ගණනින් | ප්‍රතිශතය | ආයතන සංඛ්‍යාව | වටිනාකම රු. දහස් ගණනින් | ප්‍රතිශතය | ආයතන සංඛ්‍යාව | වටිනාකම රු. දහස් ගණනින් | ප්‍රතිශතය | ආයතන සංඛ්‍යාව | වටිනාකම රු. දහස් ගණනින් | ප්‍රතිශතය |
| 1· ආහාර පාන සහ දුම්කොළ නිෂ්පාදිත .. | 221 | 703,593 | 31·1 | 41 | 79,118 | 90·1 | 8 | 6,832 | 14·0 | 14 | 1,496 | 7·2 |
| 2· රෙදිපිළි ඇඳුම් පැළඳුම් සහ සම් කර්මාන්තය .. | 479 | 364,411 | 16·1 | 62 | 3,728 | 4·2 | 44 | 14,099 | 28·9 | 21 | 6,035 | 29·0 |
| 3· දැව සහ දැව නිෂ්පාදිත (ගෘහ භාණ්ඩ ඇතුළුව) .. | 8 | 12,510 | 0·5 | — | — | — | 2 | 18,064 | 36·9 | — | — | — |
| 4· කඩදාසි සහ කඩදාසි නිෂ්පාදිත .. | 60 | 78,294 | 3·4 | — | — | — | 4 | 393 | 0·8 | 3 | 465 | 2·2 |
| 5· රසායනික ද්‍රව්‍ය ඛණිජ තෙල් ගල් අඟුරු රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත .. | 158 | 546,642 | 24·2 | 16 | 1,800 | 2·1 | 9 | 3,435 | 7·0 | 7 | 11,083 | 53·3 |
| 6· ලෝහ නොවන ඛණිජ නිෂ්පාදිත (ඛණිජ තෙල් සහ ගල් අඟුරු හැර) .. | 47 | 164,164 | 7·3 | 4 | 637 | 0·7 | 3 | 359 | 0·7 | 4 | 915 | 4·5 |
| 7· මූලික ලෝහ නිෂ්පාදිත .. | 1 | 67,520 | 3·0 | — | — | — | — | — | — | — | — | — |
| 8· සකස් කළ ලෝහ භාණ්ඩ යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහණ උපකරණ .. | 257 | 297,413 | 13·1 | 6 | 855 | 1·0 | 8 | 5,689 | 11·6 | 7 | 651 | 3·1 |
| 9· නිෂ්පාදිත භාණ්ඩ අ·ස·නො· .. | 53 | 28,591 | 1·3 | 7 | 1,624 | 1·9 | 2 | 50 | 0·1 | 2 | 149 | 0·7 |
| එකතුව .. | 1,284 | 2,263,138 | 92·7 | 136 | 87,762 | 3.6 | 80 | 48,921 | 2·0 | 58 | 20,794 | 0·8 |

**II (අා) 9 වැනි සංඛ්‍යා සටහන**

**පිහිටීම (1972)**

| නැගෙනහිර පළාත | | | වයඹ පළාත | | | ඌව පළාත | | | උතුරු මැද පළාත | | | සබරගමු පළාත | | | එකතුව | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | නිෂ්පාදනය | | | නිෂ්පාදනය | | | නිෂ්පාදනය | | | නිෂ්පාදනය | | | නිෂ්පාදනය | | | නිෂ්පාදනය | |
| ආයතන සංඛ්‍යාව | වටිනාකම රුපි. දහස් ගණනින් | ප්‍රතිශතය | ආයතන සංඛ්‍යාව | වටිනාකම රුපි. දහස් ගණනින් | ප්‍රතිශතය | ආයතන සංඛ්‍යාව | වටිනාකම රුපි. දහස් ගණනින් | ප්‍රතිශතය | ආයතන සංඛ්‍යාව | වටිනාකම රුපි. දහස් ගණනින් | ප්‍රතිශතය | ආයතන සංඛ්‍යාව | වටිනාකම රුපි. දහස් ගණනින් | ප්‍රතිශතය | ආයතන සංඛ්‍යාව | වටිනාකම රුපි. දහස් ගණනින් | ප්‍රතිශතය |
| 5 | 5,885 | 46·0 | 11 | 1,110 | 16·5 | — | — | — | 2 | 594 | 90·0 | 2 | 57 | 70·3 | 304 | 798,685 | 32·7 |
| 8 | 584 | 4·6 | 16 | 4,599 | 68·5 | 7 | 928 | 59·8 | 1 | 45 | 6·8 | 1 | 24 | 29·6 | 639 | 394,453 | 16·2 |
| — | — | — | 1 | 110 | 1·6 | — | — | — | — | — | — | — | — | — | 11 | 30,684 | 1·2 |
| — | — | — | — | — | — | — | — | — | — | — | — | — | — | — | 67 | 79,152 | 3·2 |
| — | — | — | 3 | 158 | 2·4 | 2 | 623 | 40·2 | — | 21 | 3·2 | — | — | — | 196 | 563,762 | 23·1 |
| 2 | 6,314 | 49·4 | 4 | 547 | 8·2 | — | — | — | — | — | — | — | — | — | 64 | 172,936 | 7·1 |
| — | — | — | — | — | — | — | — | — | — | — | — | — | — | — | 1 | 67,520 | 2·8 |
| — | — | — | 2 | 186 | 2·8 | — | — | — | — | — | — | — | — | — | 280 | 304,794 | 12·5 |
| — | — | — | — | — | — | — | — | — | — | — | — | — | — | — | 64 | 30,414 | 1·2 |
| 15 | 12,783 | 0·5 | 37 | 6,710 | 0·3 | 9 | 1,551 | 0·1 | 4 | 660 | 0·03 | 3 | 81 | 0·003 | 1,626 | 2,442·400 | 100· |